**සීතාවකපුර නගර සභාව - 2022**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**සීතාවකපුර නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.**

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාවවිසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය - 2017 අනුව මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් කරුණු හෙළිදරව් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යොමුගත වගන්ති යටතට නොගැනෙන වත්කම් සියල්ල ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවත්, වාර්ෂිකව කල් පිරෙන එකතු වටිනාකම රු.27,163,088 ක් වූ ස්ථාවර තැන්පතු 05 ක වටිනාකම වත්කම් හා වගකීම් ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි. | 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් නොකරන ලද මංමාවත්, බෝක්කු සහ පාලම් සඳහා ණය හිමි ලෙස වෙන් කළ රු.4,057,431 ක් කෙරිගෙන යන වැඩ ගිණුම වෙනුවට මංමාවත් බෝක්කු හා පාලම් ගිණුමට හර කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව. | වත්කම් නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ කෙරිගෙන යන සංවර්ධන වැඩ වෙනුවෙන් ණය හිමි ලෙස වෙන්කරන ලද රු.2,221,929 ක් අලුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙය නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වත්කම් හඳුනාගෙන නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ගෙවූ රු.2,212,780 ක් මංමාවත්, බෝක්කු හා පාලම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම් නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) 2021 වර්ෂයේ දී නගරසභා ගොඩනැගිල්ල සඳහා වැඩියෙන් ගිණුම්ගත කළ රු.107,814 ක් වෙනුවට රු.3,098,533 ක් ගොඩනැගිලි ගිණුමට බැර කිරීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණ රු.2,990,719 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ක්ෂය වටිනාකමද රු.74,768 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව. | -එම- |
| (ඉ) 2022 වර්ෂයේ ණය හිමි ශේෂය තුළ ඇතුළත් 2023 මාර්තු30 දිනවන විටත් ස්ථාපනය කර නොමැති රු.800,000 වටිනා පුස්තකාල මෘදුකාංගය වෙනත් යටිතල පහසුකම් ලෙසට ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ මිලදී ගැනීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වූ බැවින් අයවැයෙන් ඒ සඳහා වෙන් කර තිබූ රු.800,000ක මුදල 2022 වර්ෂය වෙනුවෙන් ණයහිමි ලෙස වෙන් කළ බව. | -එම- |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ කඩ කාමර සඳහා ලැබුණු අත්තිකාරම් මුදල රු.5,119,500 පුනරාවර්තන නොවන ගිණුම් සඳහා රජයෙන් කල මාරු කිරීම් වලට ඇතුළත් කර තිබුණි. | කඩ කාමර සඳහා එකවර ලැබෙන කඩකුලිය අය ශීර්ෂ 115-06-5200 ට ඇතුලත් කරන අතර ලැබීම් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී | නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සටහන් අංක 5 යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කල මාරුකිරීම් ලෙස දක්වා ඇති බව. | |
| (උ)සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය රු.1,986,381 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ක්ෂයවීම් ගණනයකර නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) 2020 හා 2021 වර්ෂවලදී පුනරාවර්තන නොවන රජයෙන් කළ මාරුකිරීම්වල වටිනාකම රු.7,877,740 කට අදාලව 2022 වර්ෂයේ දී ආදායමට මාරු කල යුතු වටිනාකම රු.787,774 ක් වුවත් රු.12,549,756 ක් ආදායම් ප්‍රකාශයට මාරු කිරීම හේතුවෙන් වර්ෂයේ අයහාරය රු.11,761,982 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව . | ආදායම් නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂ සනාථ කිරීම් අනුව, සභාව සතු ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.28,008,185ක් වු අතර වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.27,865,707 ක් වූයෙන් රු.142,478 ක වෙනසක් විය. | 2022.12.31 දිනට බැංකු ශේෂ සනාථ කිරීම් අනුව සභාව සතු ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.27,865,707.00 ක් ගිණුම්ගත කර ඇත. | වෙනසට හේතු පරීක්ෂා කර අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මු.රෙ.571 | 2022 දෙසැම්බර් 31 දිනට රු.27,732,700ක් වටිනා වර්ෂ 03 කට වැඩි විවිධ තැන්පතු නියාදනය කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 කට වඩා වැඩි විවිධ තැන්පතු සඳහා මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කරමින් පවතින බව. | මු.රෙ. අනුව තැන්පතු ගිණුම් ශේෂ නියාදනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.**15,143,714** ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.**32,239,840**ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 32,211 | 32,142 | 22,543 | 28,955 | 22,390 | 31,347 | 26,492 | 19,356 |
| (ii) | කුලී | 41,165 | 31,367 | 33,607 | 4,490 | 45,000 | 31,096 | 10,684 | 9,439 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,293 | 237 | 1,095 | - | 1,397 | 588 | 588 | |
| (iv) | වෙනත් ආදායම් | 13,407 | 30,821 | 13,206 | - | 6,061 | 25,742 | 5,742 | 24,946 |
| | | 88,076 | 94,567 | 70,451 | 33,445 | 74,848 | 88,773 | 43,506 | 53,741 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2022** දෙසැම්බර් **31** දිනට සභාවට අය විය යුතු හිඟ වරිපනම් බදු ආදායම රු.**23,784,454** ක් විය. | අදාල හිඟ මුදල් සභාවේ නිලධාරීන් මාර්ගයෙන් එකතු කිරීම සිදු කරන අතර ජංගම සේවා, ගෙයින් ගෙට යාම, රතු නිවේදන නිකුත් කරමින් මෙම හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී ආදායම රු.**4,491,950**ක් වූ අතර මෙම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කඩකුලී නොගෙවමින් පැහැර හරින්නන් හට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට කටයුතු සම්පාදනය කොට ඇති බව. | හිඟ කඩකුලී අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **2022** දෙසැම්බර් **31** දිනට සභාවට අය විය යුතු හිඟ තානායම් කුලිය රු.**7,075,592** ක් විය. | අදාල හිඟය අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව සාකච්ඡා කිහිපයක් පවත්වා ලිපි මාර්ගයෙන් අදාල ආයතන දැනුවත් කොට ඇත. රාජ්‍ය ආයතනයකට විරුද්ධව තවත් රාජ්‍ය ආයතනයකට නෛතිකව ක්‍රියාත්මක වීමට නොහැකි අන්දමේ කැබිනට් මණ්ඩල තීරණයක් ඇති බැවින් අදාල තානායම් කුලිය සම්බන්ධයෙන් ගරු අධිකරණයේ නඩු පවරා නොමැති අතර සියලු අධිකාරීන් දැනුවත් කොට ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | රු.**516,862**ක් වටිනා විනෝද බදු වටිනාකම දෙසැම්බර් **31** දිනට නිරවුල් වී නොතිබුණි. | රු.**516,862**ක විනෝද බදු හිඟ මුදලක් අදාල විනෝද බදු අයකරගැනීමේ ලේඛන මගින් තහවුරුවක් කර ගැනීමට නොහැකි බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2020** සහ **2021** වර්ෂවලදී නගර සභාව විසින් සිදුකර තිබූ ගොඩනැගිලි හා ඉඩම් සමීක්ෂණයේ දී දේපළ සම්බන්ධ වපසරිය හඳුනාගෙන නොතිබීම, වල් බිහිවී අලුත්වැඩියා කළ යුතු ප්‍රජාශාලා හා අනවසර ඉදිකිරීම් මෙන්ම නඩත්තු කල යුතු පොදු ස්ථාන පවතින බව වාර්තා කර තිබුණද, එම දේපල හඳුනාගත හැකි පරිදි වර්ගීකරණය කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | සභාව සතු දේපල නීත්‍යානුකූල කිරීමට කටයුතු කරමින් පවතී.නගර සභා බල ප්‍රදේශය තුළ වල් බිහිවී තිබූ ප්‍රජාශාලා අවට පිරිසිදු කිරීමේ කටයුතු සිදුකරනු ලැබූ අතර, අළුත්වැඩියා කළයුතු ප්‍රජාශාලා පවතින ප්‍රතිපාදන මත ඉදිරියේදී අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | සභාව වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **2022** දෙසැම්බර් **31** දිනට ණයහිමි කාල විශ්ලේෂණය අනුව වර්ෂයක කාලය ඉක්මවූ ණය හිමි ශේෂය රු.**12,146,371** ක් විය. | **2022.12.31** දිනට ඉදිරියට ගෙන ආ මුළු ණයහිමි ශේෂය රු. **12,252,370** ක් වන අතර **2023.04.20** දින වන විට මෙම ශේෂය රු. **12,146,371**ක් බව දන්වමි. මෙම ණයහිමි ශේෂයක් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ණය ශේෂය නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **1989** ජුනි **09** දිනැති අංක **248/334** දරණ ගිවිසුම අනුව **1988** ජුලි **01** දින තිස් අවුරුදු බදු පදනම යටතේ සභාව සතු භූමිය ලංකා බැංකුව සඳහා බදු දී තිබුණි. එම බදු ගිවිසුම අනුව මාසික බදු කුලිය රු.**80,000** ක් වුවද, **2018** බදු කාලය අවසන් වූ පසු තක්සේරු දෙපාර්තමේන්තුවේ නව තක්සේරුව අනුව මාසික බදු කුළිය රු.**475,000** ක් වී තිබුණි. | මේ වන විට අවිස්සාවේල්ල ගරු දිසා අධිකරණයේ නඩු අංක **29081/19** යටතේ නඩුකරයක් පවතින අතර, අදාල නඩුකරයේ තීන්දුව මත ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

නව තක්සේරුව මත බදු අය නොවීම හේතුවෙන් **2018 ජූලි 01 සිට 2022 නොවැම්බර් 18** දක්වා අය විය යුතු කුලී ආදායම **රු.22,561,718 ක් වී තිබුණි.**

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් **2021** වර්ෂයේ ඉදිකරන ලද රු.**4,522,729** ක් වටිනාකමැති කාර්යාල ගොඩනැගිල්ලේ ඉහල මාලයේ ඇති ලේඛනාගාරය සමාලෝචිත වර්ෂය අවසන් වන විටද වැඩ නිම නොකර ඌන උපයෝජිතව පැවතුණි. | කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා පළාත් සභා ප්‍රතිපාදන යටතේ මුදල් වෙන් වුවද එම ප්‍රතිපාදන නොලැබුණු බැවින් සභා අරමුදල් යොදවා ලේඛනාගාර කොටස ප්‍රයෝජනයට ගත හැකි පරිදි වැඩ නිමකර ඇත. ඉහළ මාලයේ ඉතිරි වැඩ සඳහා ප්‍රතිපාදන වෙන් වූ වහාම ඉදිරි කටයුතු සිදු කරන බව. | ප්‍රතිපාදන සළසාගෙන හෝ සභා අරමුදල්වලින් හෝ ඉතිරි වැඩ කඩිනමින් ඉටු කළ යුතු වේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගරසභා පරිපාලනය යටතේ පවතින නිල නිවාස **06** ක ගිවිසුම් කාලය අවසන් වී වර්ෂ **01 – 04** ත් අතර කාලයක් ගත වී ඇතත් නැවත ගිවිසුමවලට එළඹීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම **2022** ජනවාරි **03** දින විශ්‍රාම ගන්නා ලද නිලධාරියෙකුගෙන් නිල නිවාසය ආපසු භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්ගත කාලය ඉක්මවා නිල නිවාසවල පදිංචිව සිටින සේවකයින්ට අස්කිරීමේ නිවේදන නිකුත් කර ඇත. නමුත් නිල නිවාස සභාවට ආපසු ලබාදී නැත. මෙම නිල නිවාසවල පරිපාලන අයිතිය පමණක් සභාව සතුවන බැවින් මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම ප්‍රමාද වී ඇති බව. | නිල නිවාසවල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ගිවිසුම් යාවත්කාලීන කළ යුතුය. |
| (ආ) | නගරසභා පරිපාලනය යටතේ පවතින ආරාධනා කන්ද වත්තේ රූඩ් **04** පර්චස් **12** ක වර්ග ප්‍රමාණයෙන් යුත් පොදු පහසුකම් ඉඩම් **02**හි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.එමෙන්ම මෙහි පර්චස් **58.18**ක අනවසර ඉදිකිරීම් කර තිබූ අතර ඒවා ඉවත්කර පොදු පහසුකම් සඳහා යොදවා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි | ආරාධනාකන්ද වත්ත බිම් කොටස් දෙක මැනුම් කටයුතු කර පිඹුරුපත් සකසා ගෙන ඇත. එහෙත් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට එම බිම් කොටස් දෙකෙහි අයිතිය නගර සභාව සතු බවට ලිඛිතව නොතිබීම ගැටළුකාරි වූ බව. | දේපල පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව සතු බවට හඳුනාගත් දේපල 141ක් වාර්තා වී තිබු අතර ,දේපළ 30ක පමණක් අයිතිය නීත්‍යානුකූල කර ගැනීමට සභාව කටයුතු කර තිබුණි. | නගර සභාව සතු බවට හඳුනා ගන්නා ලද දේපල 141 අතුරින් 111 සඳහා නීත්‍යානුකූල ලිපි ලේඛන සකසා ගත යුතුව ඇත. දේපල වල අයිතිය තහවුරු කළ හැකි හා නොහැකි සියලු දේපල මැනුම්කටයුතු කර පිඹුරුපත් සැකසීමටත්, ප්‍රකාශන ඔප්පු සකසා ගැනීමටත්, කටයුතු කරමින් පවතින බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දී සභාවට මහජන පැමිණිලි 42 ක් ලැබී තිබු අතර ඉන් පැමිණිලි 21 ක් විසඳා නොතිබුණි. | 2022 වර්ෂයට අදාලව මහජන පැමිණිලි ලේඛනය අනුව පැමිණිලි 42 ක් ලැබී ඇති අතර ඉන් පැමිණිලි 21 ක් විසදීමට කටයුතු කර ඇති බව. | -එම- |